**Provincial Department of Education- Sabaragamuwawa**

**Sathi Pasala**

: SubjectJAPANESELANGUAGE

Week: 02

Grade: 12

Prepared by: K.O.Premathilake, Kuruwita Central Collage

Province/ Weekly School Department of Education,Sabaragamuwa


# Unit 1 – 2

きょうしつ　ことば

# 教室の言葉

## පන්ති කාමරයේ දී භාවිතා වන වචන

**Aim** *පන්ති කාමරයේ දී භාවිතා වන වචන පිළිබඳ ව මූලික දැනුමක් සහ අවබෝධයක් ලබා ගැනීම.*



පන්ති කාමරයේ දී නිරතුරුව ම භාවිතා වන උපදෙස් ලබා දීමේ ආකාරයන් සුබ පැතීමට භාවිතා වන යෙදුම් මෙන්ම පන්ති කාමරයේ දී භාවිතා වන විවිධ වචන පිළිබඳ ව අවබෝධයක් ලබා ගනිමු.

- Hajimemashou පටන් ගමු




- Owarimashou ඉවර කරමු



Please Sit Down

- Suwatte kudasai කරුණාකර වාඩි වෙන්න

- Tatte kudasai කරුණාකර නැගිටින්න



Please Stand Up

- Yonde kudasai කරුණාකර කියවන්න



Please Read

- Kaite kudasai කරුණාකර ලියන්න




- Kiite kudasai කරුණාකර සවන් දෙන්න



Please Listen

- Mite kudasai කරුණාකර බලන්න



Please Look

- Hanashite kudasai කරුණාකර කතා කරන්න




- Te o agete kudasai කරුණාකර අත ඔසවන්න



- Tetsudatte kudasai කරුණාකර උදව් කරන්න




- Chotto matte kudasai කරුණාකර මොහොතක් ඉන්න




- Shizuka ni shite kudasai නිශ්ශබ්ද වන්න



- Wakarimasuka තේරෙනවද

- Hai,wakarimasu ඔව්, තේරෙනවා

- Iie,wakarimasen නැහැ, තේරෙන්නේ නැහැ




- 第 1－1 課の practice A, B, C をしなさい。［Page 4 grade12 part1］

**Provincial Department of Education- Sabaragamuwawa**

**Sathi Pasala**

: SubjectJAPANESELANGUAGE

Week: 02

Prepared by: K. O. Premathilake, Kuruwita Central Collage

Grade: 12

# 第 1–2 課　私(わたし)はサチニです

## Aim :- පුද්ගල නාම භාවිතයෙන් තමා ව හඳුන්වා දීමට හැකි වීම

## Warming up　どこの国旗(こっき)でしょうか。知(し)っていますか。







## Words

あなた、～さん、アメリカ、インド、コロンボ、スリランカ、女(おんな)の人(ひと)、兄(あに)、医者(いしゃ)、会社員(かいしゃいん)、

彼女(かのじょ)、彼(かれ)、学生(がくせい)、銀行員(ぎんこういん)、～君(くん)、高校生(こうこうせい)、～人(じん)、女子高(じょしこう)、先生(せんせい)、大学生(だいがくせい)、誰(だれ)、父(ちち)、中国(ちゅうごく)、

友達(ともだち)、名前(なまえ)、何(なん)、～年生(ねんせい)、私(わたし)




Focus on

- N1　　は　N2 です。
- N3　　も　N2 です。

N = Noun

සරළ වක්‍යයක් ගොඩ නැගීමේ දී ඉතා වැදගත් වේ. සරළ වාක්‍යයක් සම්පූර්ණ කිරිම හා ශිෂ්ට සම්පන්න බවට පත් කිරීම මෙයින් සිදු වේ. කර්තෘ ගේ ඒක වචන බහු වචන භේදය ට අනුව මෙය වෙනස් නොවේ. කර්තෘ ඒක වචන වුව ද බහු වචන වුව ද වාක්‍ය අවසානයේ අපි භාවිතා කරන්නේ です යන්නයි. මෙය වෙනස් වන්නේ කාල භේදය සහ ඇත නැත යන අර්ථ අනුවයි.

れい ：

1. 私(わたし)はサチニです。

　　මම සචිනි වෙමි.

2. 私(わたし)は高校生(こうこうせい)です。

මම උසස් පාසල් ශිෂ්‍යාවක් වෙමි.

3. 私(わたし)は スリランカ人(じん)です。

මම ශ්‍රී ලාංකිකයෙක් වෙමි.

4. 私(わたし)は大学生(だいがくせい) ではありません。

මම විශ්ව විද්‍යාල ශිෂ්‍යාවක් නොවෙමි.

5. A: あなたは高校生(こうこうせい)ですか。

ඔබ උසස් පාසල් ශිෂ්‍යයෙක් ද?

B: はい、高校生(こうこうせい)です。

ඔව්, මම උසස් පාසල් ශිෂ්‍යයෙක්.

6. 私(わたし)も高校生(こうこうせい)です。

මම ත් උසස් පාසල් ශිෂ්‍යයෙක්.

7. A: お名前(なまえ)は何ですか。

නම කුමක් ද ?

B: サチニです。

සචිනි වේ.




**です හි කාල භේදය සහ ඇත, නැත යන ස්වරූප**

| です | ඇත | නැත |
|---|---|---|
| වර්තමාන කාලය | です | ではありません |
| අතීත කාලය | でした | ではありませんでした |

れい:

- 私は 大学生です。

මම විශ්ව විද්‍යාල ශිෂ්‍යයෙක් වෙමි.

- 私は大学生ではありません。

  මම විශ්ව විද්‍යාල ශිෂ්‍යයෙක් නොවෙමි.
- 私は大学生でした。

  මම විශ්ව විද්‍යාල ශිෂ්‍යයෙකු විය.
- 私は大学生ではありませんでした。

  මම විශ්ව විද්‍යාල ශිෂ්‍යයෙක් නොවීය.

- も は同(おな)じものを示(しめ)すときに使(つか)います。
- මෙම නිපාතය " ත් " යන අදහසින් භාවිතා කරයි.
- උදා : මමත් / තාත්තත් / යහළුවාත් යනාකාරයට ත් ශබ්දය සමග වචන භාවිතයේ දී මෙම "මො / も " නිපාතය භාවිතා කරනු ලබයි.

れい:

サチニ さんは高校生(こうこうせい) です。サンカさんも高校生(こうこうせい)です。

සචිනි උසස් පාසල් ශිෂ්‍යාවක් වේ. සංඛ ත් උසස් පාසල් ශිෂ්‍යයෙකු වේ.



- ප්‍රශ්නයක් අසන විට වාක්‍ය අවසානයේ です ට か එකතු කරනු ලැබේ.

れい:

サチにさんは高校生ですか

සචිනි උසස් පාසල් ශිෂ්‍යාවක් ද?

- 第 1－2 課の practice A, B, C をしなさい。[Page 7 grade12 part1]

**Provincial Department of Education- Sabaragamuwawa**

**Sathi Pasala**

: SubjectJAPANESELANGUAGE

Week: 02


Grade: 12

Prepared by: K.O.Premathilake, Kuruwita Central Collage


# Unit 1 - 2 ひらがな

## හිරගනා අකුරු ලියමු

**Aim** *හිරගනා අක්ෂර නිවැරදි ව හඳුනා ගනිමින් අක්ෂර ලිවීමේ රීති වලට අනුකූලව ලිවීම සහ නිවැරදි ව කියවීම.*



අපි た、ち、つ、て、と (ත, චි, ත්සු, තෙ, තො ) දක්වා ලියන ආකාරය බලමු



Copyright © learn-japanese-adventure.com

## විශේෂ කරුණු

→ මෙහි ති අක්ෂරය නොමැත. ඒ වෙනුවට භාවිතා වන්නේ චි අක්ෂරයයි. ち


→මෙහි තු අක්ෂරය නොමැත.ඒ වෙනුවට භාවිතා වන්නේ ත්සු අක්ෂරයයි. つ

ඉන් පසු අපි な、に、ぬ、ね、の ( න, නි, නු, නෙ, නො ) දක්වා ලියන ආකාරය බලමු.



Copyright © learn-japanese-adventure.com

දැන් අපි は、ひ、ふ、へ、ほ （ හ, හි, ෆු,හෙ, හො ） දක්වා ලියන ආකාරය බලමු.




Copyright © learn-japanese-adventure.com

විශේෂ කරුණු

→ මෙහි හු අක්ෂරය නොමැත. ඒ වෙනුවට භාවිතා වන්නේ ෆු අක්ෂරයයි. ふ

ま、み、む、め、も ( ම, මි, මු, මෙ, මො ) ලියන්නේ මේ ආකාරයටයි.



Copyright © learn-japanese-adventure.com

ඔබ ගේ 日本語の文字 පෙළ පොතෙහි පිටු අංක 07, 08, 09, 10 සහ 11 හි ඇති අභ්‍යාස කරන්න.